මානව සම්පත් අභිවර්ධන ආයතනය - කොළඹ විශ්වවිද්‍යාලය

මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලා අංක 09

## දෙවන සෙමෙස්තර පරීක්ෂණය

(පවත්වන ලද්දේ 2020 සැප්තැම්බර්/ඔක්තෝබර්)

## DDAMS 1007 – මත්ද්‍රව්‍ය නීතිය

උපදෙස්

(1) පහත දක්වා ඇති උපදෙස් පිළිපදිමින් ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැ තුනයි (03).

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) හා පිටු දෙකකින් (02) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) විභාගය අවසානයේදී සියලුම පිළිතුරු පත්‍ර එකට ගැට ගැසිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නයක් හෝ පිටුවක් මුද්‍රණය වී නොමැති නම් ඒ බව වහාම ශාලාධිපති වෙත දැනුම් දෙන්න.

01. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ තැනැත්තන්ට ප්‍රතිකාර කිරීම හා පුනරුත්ථාපනය කිරීම සඳහා 2007 අංක 54 දරණ ඖෂධ වලට ඇබ්බැහි වූ තැනැත්තන් ප්‍රතිකාර හා පුනර්ත්ථාපනය කිරීමේ පනත මගින් පනතේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා කවර විධිවිධාන හඳුන්වා දී තිබේද? සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

02. 1988 මාදක ඖෂධ සහ මනෝවර්තක නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ සහ 1990 මාදක ඖෂධ සහ මනෝවර්තක පිළිබඳ සාර්ක් සම්මුතියේ විධිවිධාන කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම විධිවිධාන ශ්‍රී ලංකාවේ දේශීය නීති පද්ධතිය තුළට හඳුන්වා දී තිබේද? සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

03. අපරාධයක් සිදු වූ බවට මුල් තොරතුරක් ලැබුණු අවස්ථාවේ සිට එම නඩු කෘත්‍ය අවසන් කිරීමේ සමස්ථ ක්‍රියාවලිය තුළ අපරාධ යුක්ති ක්‍රියාදාමයෙහි නීතිය ක්‍රියාත්මක කිරීමේ පළමු ආයතනය ලෙස පොලිසියෙහි කාර්යභාරය, මැදිහත්වීම, බලතල සහ යුතුකම් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඒ සඳහා 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ ප්‍රතිපාදන කෙසේ අදාළ වන්නේ දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

04. අද දවස වනවිට 1980 අංක 27 දරණ විලවුන්, උපකරණ සහ ඖෂධ පනතේ ප්‍රතිපාදන අභිබවා යමින් 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ ප්‍රතිපාදන බලාත්මකව පවතී. සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

05. සැකකරුවකු කරනු ලබන වරද කියාපෑමක් අපරාධ නඩුවකදී සාක්ෂියක් ලෙස අදාළ කරගත හැකිද; අධිකරණයක සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විමසන්නේ කෙසේද; සාක්ෂිකරුගේ සාක්ෂියේ විශ්වාසනීයත්වය බිඳහෙළන්නේ කෙසේද, යන කරුණු සම්බන්ධයෙන් 1895 අංක 14 දරණ සාක්ෂි ආඥා පනත මඟින් ඉදිරිපත් කරනු ලබන විධිවිධාන මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

06. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයාගේ නිසි අවසරයකින් තොරව විෂවර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග නිෂ්පාදනය කිරීම, ජාවාරම් කිරීම, ආනයනය හෝ අපනයනය කිරීම, සන්තකයේ තබා ගැනීම තහනම් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළට කවර ව්‍යවස්ථාවක්/පනතක් හඳුන්වා දී තිබේද? එම ව්‍යවස්ථාවේ ඇති ප්‍රතිපාදන කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

07. පහත සඳහන් ඒවායින් දෙක (02) ක් පිළිබඳව සාකච්ඡා කරන්න

i. ශ්‍රී ලංකාවේ සාක්ෂි නීතියේ ප්‍රධාන මූලාශ්‍රය වන 1895 අංක 14 දරණ සාක්ෂි ආඥා පනත තුළ හඳුනාගත හැකි විවිධ සාක්ෂි වර්ග.

ii. 1984 අංක 13 දරණ විෂවර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත මඟින් හඳුන්වා දී ඇති වැදගත් නෛතික ප්‍රතිපාදන

iii. මහජන සාමය ආරක්ෂා කිරීමට සහ මහජන පීඩාව වැළැක්වීමට 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනත මඟින් හඳුන්වා දී ඇති වැදගත් නෛතික ප්‍රතිපාදන

(ලකුණු 10 X 2 = 20)

*****